ih, yulu wejrK
*All Rights Reserved*

# මධ්‍ය වාර පරීක්ෂණය 2015
# ඉතිහාසය

**9 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1818 නිදහස් අරගලය මර්ධනය කිරීමේ වගකීම පවරන ලද්දේ,
(1) කිවුලේගෙදර මොහොට්ටාලටයි. (2) කැප්පෙටිපොල නිලමේටයි.
(3) ඇහැලේපොල අධිකාරමටයි. (4) පිළිමතලව්වේ අධිකාරමටයි.

02 කඩසාප්පු බද්ද, සුනඛ බද්ද, කරත්ත බද්ද යන බදු වර්ග පැනවීම හේතුවක් වූයේ,
(1) 1848 අරගලයටයි. (2) 1818 අරගලයටයි.
(3) 1797 අරගලයටයි. (4) අමද්‍යප ව්‍යාපාරය පිහිටුවීමටයි.

03 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන විට මෙරට ආණ්ඩුකාරයා ලෙස කටයුතු කළේ
(1) විල්මට් හෝර්ටන් (2) එඩ්වඩ් බාන්ස්
(3) චාල්ස් මැකාර්ති (4) විලියම් ග්‍රෙගරි

04 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගින් සිදුකරන ලද වැදගත්ම දේශපාලන ප්‍රතිසංස්කරණය වන්නේ,
(1) නව උසාවි පද්ධතියක් හඳුන්වා දීම.
(2) අනිවාර්ය සේවා රාජකාරිය අවලංගු කිරීම.
(3) උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම.
(4) ව්‍යවස්ථාදායක හා විධායක සභා ආරම්භ කිරීම.

05 1833 ව්‍යවස්ථාදායක සභාවට මුලින්ම තේරිපත් වූ සිංහල මන්ත්‍රීවරයා
(1) ප්‍රැන්සිස් මොලමුරේ (2) ජොහැන්නස් ග්‍රෙඩ්පි විජේකෝන් පණ්ඩිතරත්න
(3) සර් ජේම්ස් පීරිස් (4) එෆ්. ආර්. සේනානායක

06 1920 විලියම් - මැනිං ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරුන් ගණන,
(1) 15 කි. (2) 21 කි. (3) 37 කි. (4) 49 කි.

07 ඩොනමෝර් කොමිසම වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ පුද්ගලයින් අතුරින් ශ්‍රී ලංකාවට ස්වරාජ්‍ය තත්ත්වයක් ඉල්ලා සිටියේ,
(1) සර් ජෙම්ස් පීරිස් ඇතුළු පිරිසයි. (2) ඒ. ඊ. ගුණසිංහ ඇතුළු පිරිසයි.
(3) පොන්නම්බලම් අරුණාචලම් ඇතුළු පිරිසයි. (4) උඩරට ජාතික සභාවයි.

08 1931 විධායක කාරක සභා ක්‍රමය ආරම්භ කළ විට සෞඛ්‍ය කටයුතු පිළිබඳ විධායක කාරක සභාවේ සභාපති තනතුරට තේරී පත්වූයේ
(1) පී. සුන්දරම් (2) සී. බටුවන්තුඩාවේ
(3) ටී. බී. පානබොක්කේ (4) එම්. එම්. මාකන් මාකර්

09 ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ප්‍රථම දේශපාලන පක්ෂය වන්නේ,
(1) ලංකා කම්කරු පක්ෂයයි. (2) ලංකා සම සමාජ පක්ෂයයි.
(3) ලංකා කොමියුනිස්ට් පක්ෂයයි. (4) එක්සත් ජාතික පක්ෂයයි.

10 ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ,
(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා (2) පොන්නම්බලම් රාමනාදන් මහතා
(3) ඊ. ඩබ්. පෙරේරා මහතා (4) ඩී. එස්. සේනානායක මහතා

11 ටී. බී. ජයා මහතා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 1947 දී කම්කරු හා සමාජ සේවා ඇමතිවරයා වීම.
(2) අමද්‍යප ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම.
(3) 1931 මීනුවන්ගොඩ ආසනයට නිතරගයෙන් තේරී පත්වීම.
(4) 1943 දී ලංකා කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීම.

12 ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය වන්නේ,
(1) උඩවලවේ ව්‍යාපාරයයි. (2) ගල්ඔය ව්‍යාපාරයයි.

(3) මහවැලි ව්‍යාපාරයයි. (4) තබ්බෝව ව්‍යාපාරයයි.

13 1947 දී පැවැත්වූ මහ මැතිවරණයෙන් වැඩි ආසන සංඛ්‍යාවක් දිනාගෙන මෙරට ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූයේ,

(1) එෆ්. ආර්. සේනානායක මහතායි. (2) ඩඩ්ලි සේනානායක මහතායි.

(3) ඩී. එස්. සේනානායක මහතායි. (4) ඩී. බී. ජයතිලක මහතායි.

14 ''රා බොන්නා උගුඩුවෙකි. රා බොන්නා වසලයෙකි.'' මත්පැන් බීමේ ආදීනව පිළිබඳව මෙම ප්‍රකාශය කර තිබෙන්නේ,

(1) ආතර් වී. දියෙස් මහතාය (2) අනගාරික ධර්මපාල තුමාය

(3) පියදාස සිරිසේන මහතාය (4) එස්. මහින්ද හිමියන්ය

15 ''ස්කන්ධ පුරාණම්, හේතු පුරාණම්, පෙරිය පුරාණම්' වැනි ද්‍රවිඩ ග්‍රන්ථ සිංහලයට පරිවර්තනය කිරීමට කටයුතු කළේ,

(1) ආරුමුග නාවලර් තුමාය (2) සිද්ධි ලෙබ්බේ තුමාය

(3) පොන්නම්බලම් රාමනාදන් තුමාය (4) හෙන්රි ඕල්කට් තුමාය

16 අද දක්වා පවතින බෞද්ධ කොඩිය මුලින්ම නිර්මාණය කර ප්‍රදර්ශනය කරන ලද්දේ,

(1) 1890 දී (2) 1895 දී (3) 1885 දී (4) 1880 දී

17 බෞද්ධ පුනර්ජීවන අවධියේ මෙරට මුද්‍රණය කරන ලද ප්‍රථම බෞද්ධ පුවත්පත නම්,

(1) ලක්මිණි පහණයි. (2) ලංකා ලෝකයයි.

(3) සුමති සංග්‍රහයයි. (4) ලක්මිණි කිරණයි.



18 දකුණුපස ඇති පින්තූරයෙන් පෙන්නුම් කරන ස්වාමීන් වහන්සේ කවුරුන්ද?

(1) එස්. මහින්ද හිමියන්ය

(2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ය

(3) වාරියපොල ශ්‍රී සුමංගල හිමියන්ය

(4) වස්කඩුවේ සුභූති හිමියන්ය

19 උඩරට රාජ්‍යය පිළිබඳව උපක්‍රමශීලීව තොරතුරු සපයාගැනීමට ක්‍රියාකළ ඉංග්‍රීසි නිලධාරියා

(1) හියු බොයිඩ් (2) ජෝන් ඩොයිලි (3) රොබට් ඇන්ඩෲස් (4) ජෝන් පීබස්

20 කන්නසාමි කුමරු, ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජ බවට පත් කරවීමට කටයුතු කළේ,

(1) ඇහැලේපොළ මහ අධිකාරමයි. (2) මොල්ලිගොඩ නිලමෙයි.

(3) පිළිමතලව්වේ මහ අධිකාරමයි. (4) එක්නැලිගොඩ මොහොට්ටාලයි.

21 1803 දී උඩරටට ආක්‍රමණයක් මෙහෙයවා අසාර්ථක බවට පත්වූ ඉංග්‍රීසි ආණ්ඩුකාර තුමා

(1) විල්මට් හෝර්ටන් (2) වෙකවුන්ට් ටොරිංටන්

(3) රොබට් බ්‍රවුන්රිග් (4) ෆ්‍රෙඩ්රික් නෝර්ත්

22 තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) රාජකාරි ක්‍රමය අවලංගු කිරීම. (2) ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම.

(3) ආරෝග්‍යශාලා පිහිටුවීම. (4) ජූරි සභා ක්‍රමය ඇති කිරීම.

23 ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම මගින් මුලින්ම අත්-පත් කරගන්නා ලද වරාය වන්නේ,

(1) ත්‍රිකුණාමල වරායයි. (2) මඩකලපු වරායයි.

(3) ගාල්ල වරායයි. (4) මන්නාරම් වරායයි.

24 ඉන්දියන් සාගර ප්‍රදේශයේ තම බලය පිහිටුවා ගැනීම පිණිස ඉංග්‍රීසීන්ට තරග කිරීමට සිදුවූයේ,

(1) ඕලන්ද ජාතිකයින් සමගයි. (2) ප්‍රංශ ජාතිකයින් සමගයි.

(3) පෘතුගීසි ජාතිකයින් සමගයි. (4) ඇමෙරිකන් ජාතිකයින් සමගයි.

25 1797 දී මුහුදු බඩ ප්‍රදේශවල ඇතිවූ විරෝධතා අරගලයට ප්‍රධාන හේතුව වූයේ,

(1) බදු එකතු කිරීමට මදුරාසියෙන් නිලධාරීන් පත්කර එවීමයි.

(2) මුදල්වලින්ම බදු ගෙවීමට නියම කිරීමයි.

(3) පොල් ගස් බද්ද ඇතුළුව අලුත් බදු කීපයක්ම පැනවීමයි.

(4) බදු අයකිරීමට ආ නිලධාරීන් ජනතාවට හිරිහැර කිරීමයි.

26 ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත්වූයේ,

(1) 1796 දී ය. (2) 1798 දී ය. (3) 1802 දී ය. (4) 1805 දී ය.

27 මියුරන් කමිටුව යනුවෙන් හඳුන්වන්නේ,

(1) අධිකරණ කටයුතු ක්‍රමවත් කිරීමේ අරමුණින් ඇතිකරන ලද්දකි.

(2) 1797 අරගලය පිළිබඳව සොයා බැලීමට පත්කළ කමිටුවකි.

(3) උඩරට රාජ්‍යයේ බලය අත්පත් කර ගැනීමට ආරම්භ කළ උපක්‍රමශීලී ක්‍රමයකි.

(4) ඉංග්‍රීසි පාලනයෙන් සිදුවූ අසාධාරණකම් සොයා බැලීමට පත්කළ එකකි.

28 මහනුවර දළදා මාළිගාවට පත්තිරිප්පුව එකතු කිරීමට පියවර ගත්තේ,

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාය. (2) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාය.
(3) රාජාධි රාජසිංහ රජතුමාය. (4) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාය.

29 1815 උඩරට ගිවිසුමට අත්සන් තැබූ නායකයින් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) කැප්පෙටිපොළ, ඇහැලේපොළ, මඩුගල්ලේ, දිඹුලාන යන දිසාවේවරු
(2) ගලගෙදර මොහොට්ටාල, මඩුගල්ලේ දිසාව, දුල්ලෑව දිසාව, රත්වත්තේ නිළමේ
(3) මොල්ලිගොඩ, පිළිමතලව්වේ, රත්වත්තේ, කැප්පෙටිපොළ නිළමේවරු
(4) ගලගොඩ, ගලගම, දඹවින්න දිසාවේ, ගොඩේගෙදර අධිකාරම්

30 වෙල්ලස්සේ අරගලයට ආසන්නතම හේතුව නම්
(1) රාජ්‍ය උරුමකරුවකු ලෙස දොරේසාමි නම් පුද්ගලයෙකු ඉදිරිපත් වීමයි.
(2) හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් මුහන්දිරම්වරයෙකු වෙල්ලස්සට පත් කිරීමයි.
(3) පොරොන්දු වූ පරිදි බුද්ධාගමට ගරු සැලකිලි නොදැක්වීමයි.
(4) ගිවිසුමේ කොන්දේසිවලට අනුව ක්‍රියා නොකිරීමයි.

31 ''අනේ කුඹියනේ - තොපටත් රජෙක් ඉන්නේ
අපට නෑ ඉන්නේ - අපේ කරුමේද මේ වන්නේ''
මෙම ප්‍රකාශය කෙරේ බලපෑ හේතුව වන්නේ,
(1) බ්‍රිතාන්‍ය පාලනය කෙරේ උඩරට ජනතාව කලකිරීමට පත්වීමයි.
(2) රජෙකු පෙනෙන්නට නොසිටීම නිසා ජනතාව තුළ සාංකාවක් ඇතිවූ බවයි.
(3) කුඹියන්ට පවා නායකයකු සිටින බවයි.
(4) පාලකයකු නැතිවීම නිසා රට අස්ථාවර වූ බවයි.

32 ''බිම්පාළු ප්‍රතිපත්තිය'' යනුවෙන් හඳුන්වන්නේ,
(1) කැරලිකරුවන්ගේ ගේ-දොර රජයට පවරාගැනීමයි.
(2) ගේ-දොර, වතු-පිටි, හව-බෝග විනාශ කිරීමයි.
(3) ජනතාව ආහාර සපයාගන්නා මාර්ග අවහිරකිරීමයි.
(4) සටන්කරුවන්ට සැඟවී සිටීමට නොහැකි ලෙස කැලෑ එළිකිරීමයි.

33 ලංකා දෙමළ සංගමය පිහිටුවීමට මුල්වී ක්‍රියා කළේ
(1) හර්බට් ස්ටැන්ලි ආණ්ඩුකාර තුමාය (2) පොන්නම්බලම් අරුණාචලම් තුමාය
(3) ඒ. ඊ. ගුණසිංහ තුමාය (4) ජී. බී. රත්නායක මහතාය

34 ශ්‍රී ලංකා වාසීන්ට සර්ව ජන ඡන්ද බලය ලැබුනේ,
(1) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ වලිනි. (2) මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ වලිනි.
(3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ වලිනි. (4) සෝල්බරි ප්‍රතිසංස්කරණ වලිනි.

35 බ්‍රිතාන්‍ය පාලන සමයේ යාපනය ඇතුළු උතුරු ප්‍රදේශවල ක්‍රමානුකූල අධ්‍යාපනයක් පවත්වාගෙන යාමට ක්‍රියා කළේ,
(1) චර්ච් මිෂනාරි සමාගමයි. (2) වෙස්ලියන් මිෂනාරි සමාගමයි.
(3) බැප්ටිස්ට් මිෂනාරි සමාගමයි. (4) ඇමෙරිකානු මිෂනාරි සමාගමයි.

36 කොළඹ - මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීමට මූලික වී ක්‍රියා කළේ,
(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (2) රත්මලානේ ධර්මාලෝක හිමි
(3) වලානේ සිද්ධාර්ථ හිමි (4) පොතුවිල ඉන්ද්‍රජෝති හිමි

37 1885 වර්ෂයේ දී සිදුවූ වැදගත් සිදුවීමක් වන්නේ,
(1) මහාබෝධි සමාගම පිහිටුවීමයි.
(2) ඕල්කට් තුමාගේ පැමිණීමයි.
(3) වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කිරීමයි.
(4) සාරානාත් හි මූලගන්ධකුටි විහාරය තැනීමයි.

38 1935 දී පිහිටුවා ගත් ලංකා සම සමාජ පක්ෂයේ නායකයා වූයේ,
(1) කොල්වින් ආර්. ද සිල්වා මහතා (2) එස්. ඒ. වික්‍රමසිංහ මහතා
(3) එන්. එම්. පෙරේරා මහතා (4) පිලිප් ගුණවර්ධන මහතා

39 පොපිමල් ව්‍යාපාරයට එරෙහිවීම, සූරියමල් ව්‍යාපාරයට සහයෝගය දැක්වීම, 1943 දී කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීම යන කාර්යයන්ට සම්බන්ධ පුද්ගලයා
(1) ටී. බී. ජයා මහතා (2) සුගීශ්වර වික්‍රමසිංහ මහතා
(3) ඊ. ඩබ්. පෙරේරා මහතා (4) ඩී. සී. සේනානායක මහතා

40 කොළඹ නගර සභාවේ ප්‍රථම සිංහල නගරාධිපතිවරයා වීමේ ගෞරවය හිමිවන්නේ,

(1 x 40 = 40)

(1) ඒ. ඊ. ගුණසිංහ මහතාටයි. (2) එෆ්. ආර්. සේනානායක මහතාටයි.
(3) ඊ. ඩබ්. පෙරේරා මහතාටයි. (4) ලෙස්ලි ගුණවර්ධන මහතාටයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01 (i) ඉතිහාසය විෂයය සම්බන්ධයෙන් දෙවන වාරය තුළ ඔබේ පන්ති කාමරයේ ක්‍රියාත්මක කළ ඇගයීම කුමක් ද?
(ii) ඒ සඳහා ප්‍රයෝජනයට ගත් පාඩම් මාතෘකාවක් ලියන්න.
(iii) ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක් ද?
(iv) ඔබේ කණ්ඩායම තොරතුරු රැස්කිරීමේ දී අනුගමනය කළ ක්‍රමයක් ලියන්න.
(v) නිර්මාණයට ඇතුළත් කළ පින්තූර / චිත්‍ර / සිතියම් 2 ක් සඳහන් කරන්න.
(vi) ඔබ විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු 2 ක් දක්වන්න.
(vii) ඇගැයීම ක්‍රියාත්මක කිරීමේ දී මතුවූ දුර්වලතාවයක් සඳහන් කරන්න.
(viii) කණ්ඩායම් නිර්මාණය ඉදිරිපත් කිරීමේ දී එහි නිර්මාණශීලීභාවය පවත්වා ගැනීමට අනුගමනය කළ ක්‍රමයක් ලියන්න. (2 x 8 = 16)

02 (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමට මිෂනාරි ව්‍යාපාරය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.
(ii) එකල බෞද්ධ ආගමික පුනර්ජීවනයේ වැදගත්කම වටහාගත් පිරිස් ඒ සඳහා ගත් පියවර 4 ක් ඉදිරිපත් කරන්න.
(iii) දකුණුපස දී ඇති පින්තූරයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.



03 (i) (a) තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට මුල්වී ක්‍රියාකිරීම
(b) අයිතිවාසිකම් දිනාගැනීම පිණිස කම්කරුවන් මෙහෙයවීම
යන කටයුතුවලට මුල්වී ක්‍රියාකළ පුද්ගලයින් පිළිවෙලින් නම් කරන්න.
(ii) දකුණුපස දක්වා ඇති A හා B පින්තූරවලින් පෙන්නුම් කරන පුද්ගලයින් නම් කර ඒ අයගෙන් ජන සමාජයට ඉටුවී ඇති සේවාවන් එක බැගින් ලියන්න.


A


B

(iii) (a) නිදහස් අධ්‍යාපනයේ පියා යනුවෙන් හඳුන්වන්නේ කවුද?
(b) එතුමාගෙන් මෙරට නිදහස් අධ්‍යාපනයට සිදුවූ සේවාව පැහැදිලි කරන්න.

04 (i) (a) ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට මහ මැතිවරණයක් පවත්වන ලද්දේ කවර වර්ෂයේ ද?
(b) එයින් ජයග්‍රහණය කළ දේශපාලන පක්ෂය කුමක් ද?
(ii) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා 2 ක් ඉදිරිපත් කරන්න.
(iii) බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1931 සිට මෙරට ක්‍රියාත්මක කරන ලද ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 2 ක් සඳහන් කර ඒවා ගැන විස්තර කරන්න.

05 (i) දකුණු පස ඇති ශ්‍රී සිතියමේ පෙන්නුම් කරන්නේ 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් ඇති කරන ලද පරිපාලන බෙදීමය. එහි අංක 1 හා 2 න් දැක්වෙන පළාත්වල ප්‍රධාන පරිපාලන නගර නම් කරන්න.




(ii) ඒ යටතේ ඇති කරන ලද ප්‍රථම ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය පහදන්න.
(iii) පහත සඳහන් වන්නේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී වරින් වර මෙරටට ලැබුණු පාලන ප්‍රතිසංස්කරණ කීපයකි. ඒවාට අදාළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල නම් අනුපිළිවෙලින් ලියන්න.
(a) ජනවාර්ගික ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම.
(b) පළාත් බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම.
(c) ප්‍රථම වරට සීමිත ඡන්ද බලයක් හඳුන්වා දීම.
(d) අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
(e) නිල නොලත් සංඛ්‍යාව ප්‍රථම වරට බහුතරය බවට පත්වීම

06 (i) බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස්වීමට මෙරට ජනයා ගෙනගිය අවසන් අරගලය 1848